2017

# නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන ලද ප්‍රායෝගික හා තාක්‍ෂණ කුසලතා විෂයය මඟින් අපේක්‍ෂිත අරමුණු පාසල තුළින් සාක්‍ෂාත් කර ගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

කිඹියගේ සනුජා හර්ෂනී ජයවික්‍රම
කෘෂිකර්ම විද්‍යාවේදී උපාධි (විශේෂ) ගෞරව 1998
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන) 2007
ලි.ප. අංකය : 609080830

අධ්‍යාපනපති උපාධිය - 2009/2010 සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය.

OPEN UNIVERSITY
72753

72753

# සංක්ෂිප්තය

පාසල් අධ්‍යාපනයට වඩාත් ප්‍රායෝගික නැඹුරුවක් ලබාදීමේ අරමුණින් යුතුව ක්‍රියාකාරී ලෝකයට අවශ්‍ය දැනුම හා කුසලතාවයන් ලබා ගැනීමට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා විෂයය විෂයමාලාවට 1999 ප්‍රථම වතාවට හඳුන්වා දී ඇත. එහි පවතින ගැටළුකාරී තත්ත්වයක් මගහරවා ගනිමින් නැවතත් 2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් මෙම විෂයය, විෂයමාලාවට නව මුහුණුවරකින් එක් කර ඇත. මෙම විෂයය කණිෂ්ඨ ද්විතියික ශ්‍රේණි සඳහා එනම් 6 සිට 9 ශ්‍රේණි දක්වා හඳුන්වා දී ඇත. වයස අවු: 11 සිට අවු: 14 දක්වා නව යොවුන්වියේ සිටින දරුවන් මෙම කාණ්ඩයට අයත් වේ.

මෙම විෂයයේ අරමුණු වලින් අපේක්ෂිත පරිදි ක්‍රියාකාරකම් ඇසුරින් සිසුන්ගේ නිර්මාණ හැකියා වැඩිදියුණු කිරීමට, කුසලතා වර්ධනයට, නව ශක්තීන් පිළිබඳ විශ්වාසය ඇති කර ගැනීමට සිසුනට අවස්ථා ලබා දිය යුතු අතර පාසලේ සුදුසු ඉගෙනුම් පරිසරයක් සකස් කරදීම අවශ්‍ය වේ. නමුත් වර්තමානයේ පාසල තුළ මෙම විෂයයෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු සම්පාදනය වේද යන්න පාසල් පද්ධතිය තුළින් පැන නැඟෙන ගැටලුවකි. මෙම විෂයයට තිබිය යුතු පිළිගැනීම පවා නොමැති තත්වයකට අද දවසේ පත්ව තිබේ. මේ නිසා ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය පාසල් වල ක්‍රියාත්මක කිරීමේදි එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කරන ලදී.

ඒ සඳහා සුවිශේෂී අරමුණු 4 ක් පිහිටුවා ගත් අතර, එම අරමුණු ඔස්සේ අධ්‍යයනය සිදු කරන ලදී.

මෙම අධ්‍යයනයේ පළමුවන අරමුණින් පර්යේෂකයා විසින් ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා විෂයය තුළ පාසල් සිසුන්ට උපකරණ, ආම්පන්න හා මෙවලම් භාවිතය තුළින් ප්‍රායෝගික කුසලතා සංවර්ධනයට ඇති අවස්ථාව පරීක්ෂා කිරීම සිදු කරන ලදි. තවද පාසලේ සිසුන්ට ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා සමූහයක් අත්පත් කර ගැනීම සඳහා විවිධ ක්‍රමවේද පිළිබඳ දැනුමක් හා හුරුවක් ලබා ගැනීමට මැනවින් සැළසුම් කළ ගුරු මඟ පෙන්වීමක් තිබේදැයි දෙවන අරමුණින් විමසා බැලීම සිදුකර ඇත. ශිෂ්‍යයින් ස්ව ශක්තිය කෙරෙහි ඇති කර ගන්නාවු විශ්වාසය මත ඵලදායි ලෙස නව නිර්මාණ කෙරෙහි යොමුවේදැයි සොයා බැලීම

මීළඟට සිදු කරන ලදි. අනතුරුව ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා විෂයය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදි.

මෙම අධ්‍යයනයේ පිහිටුවා ගත් අරමුණු කරා ළඟා වීමේදී ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා විෂයය සඳහා පාසල්වල සම්පත් හිඟවීම, තිබෙන සම්පත් ගුරුවරුන් අතර නිසි ලෙස බෙදී නොයාම, ගුණාත්මක යෙදවුම් කලට වේලාවට ප්‍රමාණවත්ව නොලැබීම, ක්‍රියාකාරකම් කාමර පාසල්වල නොතිබීම පිළිබඳ අනාවරණය කරගත හැකිවිය. තවද විෂයය ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකවන ගුරුවරුන් නිපුණතා පාදක අධ්‍යයනය පිළිබඳව දැනුවත්ව සිටියද පාසල තුළ ක්‍රියාකාරකම් පාදක ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම ක්‍රියාත්මක කිරීම පිළිබඳ තවදුරටත් සංවර්ධනය විය යුතු තත්ත්වයේ පවතින බැව් අනාවරණය විය. තවද මෙම විෂයය ඉගෙනිමෙන් සිසුන් නව නිර්මාණකරණයට යොමු විම අඩු බවත් ඊට බාධා පවතින බවත් අනාවරණය විය.

ඒ අනුව සිසුන්ට උපකරණ, ආම්පන්න හා මෙවලම් භාවිතය තුළින් ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා සංවර්ධනයට පාසල තුළින් ඉඩකඩ සළසා දීම ප්‍රමාණවත් නොවන බව නිගමනය කළ හැකි විය. මෙම විෂයය පාසල තුළ ක්‍රියාත්මක විමේදී මැනවින් සැළසුම් කළ ගුරු භූමිකාව තවදුරටත් සංවර්ධනය විය යුතු බැව් ද මෙම විෂයය ඉගෙනීමෙන් ස්ව ශක්තිය කෙරෙහි ඇති කර ගන්නා වූ විශ්වාසය මත පාසල් නව නිර්මාණ කෙරෙහි යොමු වීම අඩු මට්ටමක පවතින බැව් අධ්‍යයනයේ නිගමන ලෙස දැක්විය හැක ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා උපාය මාර්ග යෝජනා ලෙස විෂයයට අදාළ ගුරුවරුන් විෂයය ඉගැන්වීමට අඛණ්ඩව යොමු කිරීම, අතරමගදී විවිධ ගුරුවරුන් මාරු නොකිරීම, ක්‍රමානුකූල පුහුණු අවස්ථා ලබා දීම, විශේෂඥ ගුරු භවතුන්ගේ සහාය ලබා ගැනීම, ක්‍රියාකාරකම් සඳහා සම්පත් සහිත ක්‍රියාකාරකම් කාමරයක් සෑම පාසලකටම සකස් කිරීම, සිසුන් නව නිර්මාණකරණයට යොමු කිරීම, වාර්ෂිකව අඛණ්ඩව බාහිර හා අභ්‍යන්තර ඇගයීම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මෙන්ම කණිෂ්ඨ ද්විතියික අධ්‍යාපනයට පමණක් සීමා වූ මෙම විෂයය අනිවාර්යය කොට ප්‍රාථමික අධ්‍යාපනයට ද ජ්‍යෙෂ්ඨ ශ්‍රේණි සඳහා ද ව්‍යාප්ත කිරීම ඉදිරිපත් කොට ඇත.

# ABSTRACT

The Subject Practical & Technical Skills has been introduced to the school curriculum in 1999 with a view to introducing a practical approach to school education to impart knowledge necessary for the world of work. This subject has been added with new facets under the 2007 education reforms. This subject was introduced to the junior secondary grades i.e. from Grades 6 to 9. The students within the age group of 11 to 14 years come under this group.

Students should be given opportunities to improve their innovative skills through activities, to develop skills, and to make them believe in new strengths. A learning environment should be created in the school to support this. But the fact that the schools are aiming at targets expected from this subject has been a problem arisen within the school system. The subject has not been given due recognition as well.

The main objective of this investigation is to find out whether the desired objectives are achieved in teaching this subject in schools.

This research was based on an investigation of the opportunities available for students to develop their Practical and Technical Skills through the use of instruments, equipment and tools. It was found out whether there is proper guidance by teachers for students to acquire Practical and Technical skills. Further attention was paid on the fact that whether the students go for productive innovations with confidence on their strengths. Finally, suggestions are made to implement the subject practical and technical skills effectively in the school system.

The following facts were revealed through this research. The researcher was able to identify some practical problems which lead to the unsuccessful implementation of this subject at schools. The shortage of resources for the

subject, unequal distribution of resources among teachers, unavailability of quality inputs on time and the non-availability of activity rooms in schools were recognized as the key problems in its implementation. Although the teachers are aware of the competency-based education, implementing activity based child centered teaching should be developed. It was revealed that the students do not go for innovations and there are obstacles for that. And the tendency to go for new innovations through their own strength is at a lower level.

The researcher arrived at the conclusion that schools do not provide enough opportunities for students to develop Practical and Technical skills by providing the students with instruments, equipment and tools.

Directing teachers to teach the Practical and Technical Skills subject continuously, preventing the transferring of teachers in the middle of the year, provision of systematic training opportunities for teachers, getting the assistance of subject experts, arranging activity rooms with resources in each school, directing students to innovate experimentation, implementing internal and external supervision system, introducing Practical and Technical Skills which is now confined to junior secondary education to primary education and senior secondary education and developing the role of the teacher further in administering this subject in schools, are the suggestions made through this research to administer the subject Practical & Technical Skills effectively in schools.